6 මට හැඟෙන අයුරින් රසිකොලොජිය
rasikalogy.blogspot.com

# ආනන්දය, කළු හංසයා දුටුවෙහි ද එසේය ස්වාමීනී !

ලෝකයේ සර්වජන ඡන්දබලය පාවිච්චි කර රට ආණ්ඩු කරන්නට ජනතා නියෝජිතයින් තේරූ රටවල් අතරින් ලංකාවට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. ඡන්දය දීම ඇරඹී ඇත්තේ ලංකාව එංගලන්තයේ යටත් විජිතයක්ව පැවති සමයේ දී, වර්ෂ 1931 දී ය. ඒ කාලයේ රටේ ජනතාව ගේ සාක්ෂරතාවය, එසේ නැති නම් අකුරු කියවා වටහා ගැනීමේ හැකියාව, අඩු වූ නිසා එක් එක් ඡන්ද අපේක්ෂකයින් සඳහා වෙනස් වර්ණයෙන් යුතු ඡන්ද පෙට්ටි භාවිතා වී ඇත. ඡන්දදායකයින් කළ යුතුව තිබුණේ තමන් ගේ ඡන්ද පත්‍රිකාව තමන් කැමති අපේක්ෂකයා ගේ වර්ණය සහිත ඡන්ද පෙට්ටියට දැමීමයි.

මේ ඡන්දයේ දී සිල් පාට (එනම් සුදු) හෝ සිවුරු පාට (එනම් කහ) වර්ණය සහිත අපේක්ෂකයින් ඒ වර්ණවලට ආකර්ෂණය අරුත් සපයමින් බෞද්ධ ඡන්දදායකයින් ගේ ඡන්දය ඉල්ලා සිටියේ යැයි පැවසේ.
පසු කලෙක රටටම සාපයක් වූ, කුප්‍රකට කුරහන් වර්ණය ගැන ඇත්තේ ද (1936) මෙ වැනිම වූ කතන්දරයකි.

ඡන්ද අපේක්ෂකයින් සඳහා විවිධ සලකුණු භාවිතා කරන්ට පටන් ගෙන ඇත්තේ ඉන් පසුවය. එයට හේතුව ද අපේ කලින් පරම්පරාවල තිබුණු සාක්ෂරතාවයේ අඩුපාඩුය. පසුව දේශපාලන පක්ෂ ලංකාවේ බිහි වීමත් සමගම, ඒ ඒ පක්ෂ සඳහා ඡන්ද සලකුණු ලියාපදිංචියේ දී ම වෙන් කරන්නට යෙදුණි. යූඇම්පීයට අලියා ලකුණත්, සිරිලංකා එකට අත ලකුණත් සින්න වී ඇත්තේ ඒ ආකාරයටයි.

මීට අමතරව, ප්‍රධාන පක්ෂ දෙක විසින් අප දන්නා පරිදි කොළ පැහැය සහ නිල් පැහැය තමන්ම අයිති කරගෙන ඇත. මෙහිදී විහිළුවට කාරණයක් වන්නේ, අද අඩ සියවසකට පසුව ලංකාවේ සාක්ෂරතාවය ඉතා ඉහළට නැග ඇති සමයක දී ද තවමත් අර සලකුණු සහ වර්ණ ඡන්දය හා අදාළ කටයුතු සඳහා භාවිතා වීමයි.
එපමණක් නොව, ප්‍රතිපත්තිමය කරුණු ගැන කෙරෙන සාකච්ඡාවලට වෙන් විය යුතු, ඡන්දය හා සම්බන්ධ කතා බහෙන් සෑහෙන කොටසක් වැයවන්නේ මේ විවිධ වර්ණ සහ සංකේත ගැන පල් හෑලි සඳහා ය.
උදාහරණයක් දැක්වුවහොත්, පසුගිය ජනාධිපති ඡන්ද කිහිපයේ දී යූඇම්පී පාක්ෂිකයින් ට අලියා ලකුණ සහ කොළ පාට අහිමි වී ඇතැයි වඩාත් දුක් වුණේ සිරිලංකා පාක්ෂිකයින් ය. නමුත් පුටුව හෝ බුලත් කොළය මිස, සිරිලංකා එකට හිමි අත ලකුණ වසර විසි පහකින් මෙහා භාවිතා වී නැති බව ඔවුන්ට අමතක වී තිබුණි.

පක්ෂ සලකුණු නිසාම ගොඩ නැගෙන මේ ආකාරයේ තවත් කතන්දර බොහෝ ඇත. රනිල් වික්‍රමසිංහව කාටූන්කාරයින් අඳින්නේ හෙණ්ඩුවක් සහිතවය. ජනාධිපති ඡන්ද සමයේ හංසයින් ගැන කවි, ගීත, විකට කතා මෙන්ම අපහාස, උපහාස ද ඇසේ. හංසයින් ගේ ශ්වේත වර්ණය නිර්මලත්වයේ සංකේතයක් ලෙස ද, හංසයා කිරි, දියෙන් වෙන්කර බොන්නට ඇති යැයි කියන ජනප්‍රවාදිත හැකියාව ඉහළ කොලිටියක් ලෙස ද, දේශපාලනික අරුත් දැක්වීම් කෙරෙනු මා අසා ඇත.

ජනාධිපති ඡන්ද උණුසුම ඉහළට නැග තිබුණු 2009 දෙසැම්බරයේ මා ලංකාවේ ගත කළ කාලයේ, අපේ එක් නෑදෑ නිවෙසක දී මහින්ද රාජපක්ෂ ගේ යම් යම් ක්‍රියා පිළිබඳව මා දෝෂාරෝපණය කරනු අසා සිටි අපේ ඥාතියෙක් "ආ! රසික පුතා හංසයෙක් වගේ?" යැයි පැවසීය.

මෙලෙස මා හංසයෙකුට සමාන කරන්නේ ඇයි දැයි මට වැටහුණේ සාමාන්‍ය තරමේ ටියුබ් ලයිට් ප්‍රමාදයකින් පසුවයි.
"අපොයි, හමුදා පාලනයක් වෙනුවෙන් නොවෙයි මං කතා කරන්නේ!" කියා මම වහා පැවසූ විට, මගේ ඥාතියා නැවතත් සලකුණු වලින් කතා කරමින් ඇසුවේ, "එහෙනං ඇයි ඔහේ බුලත් කොළේට විරුද්ධව කතා කරන්නේ?" කියායි.

ඔය පරණ කතා මට සිහිවූයේ පසුගිය දිනවල නවසීලන්තයේ දී දුටු එක්තරා සත්වයෙක් නිසා ය.

මේ කළු හංසයෙකි.
නිකං කළු හංසයෙක් නොව "කළුම කළු, කට්ට කළු, ලිපේ තියෙන දැලි අඟුරු, අහසේ පාවෙන කළු වලාකුළු" මෙන් කළු හංසයෙකි.

මේ ආකරයේ කළු හංසයින් නවසීලන්තයේ පමණක් නොව ඕස්ට්‍රේලියාවේ ද සිටිති. ඕස්ට්‍රේලියාවේ ඔවුන් වැඩියෙන් ම ඇති ප්‍රදේශය නම් බටහිර ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර අසලින් ගලා බසින ස්වෝන් ගංගාවේ යැයි සිතමි. පර්ත්වාසී සිංහල කවියෙකුවන සුනිල් ගෝවින්නගේගේ කවිවල මේ කළු හංසයන් නිබඳව සරති!

දැන් අර හංසයින් යනු ශ්වේත හංසයින් පමණක් ය කියා හිතමින් ඡන්ද සමයේ හංසයින් ගැන කවි, ගී, කතා ගෙතූ, කාටූන් ඇඳි අය, මේ කළු හංසයින් කෙලෙස අර්ථ නිරූපණය කරයිද?
ඡන්ද සලකුණු අනුව නොව ඡන්දයෙන් පසු ඔවුන්ගේ ක්‍රියාකලාපය අනුව මිස හංසයින් සුදු ද, කළු ද යන්න කිව නොහැකිබව නම් සත්‍යයකි!




